# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2266/36 - 2022 පෙබරවාරි මස 09 වැනි බදාදා - 2022.02.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

2022.01.01 සිට 2022.12.31 දක්වා ආදායම් වියදම් ඇස්තමේන්තුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හයවන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අවසරදීම

2022 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වසරක සේවා වියදම සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, එම කාලය තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ කාලය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුශාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ නියෝගයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා වන මා විසින් මෙසේ පනවනු ලැබේ.

අවසරය ලබා දීම.

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසරක කාල සීමාව සඳහා සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති රුපියල් තිස්හත් බිලියන එකසිය අසූනව මිලියනයක් (රු. 37,189,000,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.


1A - PG 5746 — 15 (2022/02)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2022 වර්ෂය සඳහා විසර්ජන.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ නියෝගයෙහි ''වසරක'' යනුවෙන් සඳහන් කරනු ලබන, 2022 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 2022 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් තිස්හත් බිලියන එකසිය අසූනව මිලියනයක් (රු. 37,189,000,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් :-

(අ) සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් හා

(ආ) සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබා ගන්නා මුදල්වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතුය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් තිස්හත් බිලියන එකසිය අසූනව මිලියනයක් (රු. 37,189,000,000) වූ මුදල මේ නියෝගයේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (i) වන උප වගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා හා එය වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

2022 වර්ෂය සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම

3. (1). 2022 මුදල් වර්ෂයක කාල සීමාව තුළදී, මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වන තීරුවෙහි සඳහන් ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්ථය, VI තීරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය.

4. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2022 මුදල් වර්ෂයේ සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන වියදම්, ඒ කාලය තුළදී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

5. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ iv වන තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2022 වර්ෂයේ අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය. තව ද, එම කාලය අවසානයේදී එම කටයුත්තේ මුළු බැරකම් VIII වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය.

2022 වර්ෂය තුළදී 3 වන වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල් වලින් අත්තිකාරම් ගෙවීම.

6. 2022 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ නියෝගයේ දෙවන උපලේඛනයේ iv වන තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන්, සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යයි ආණ්ඩුකාරවරයා සලකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්ථය එම උපලේඛනයේ පස්වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්ම විය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, මා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතුය.

වැඩ සටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩ සටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශිර්ෂය යටතේම වූ වෙනත් වැඩසටහනකට හෝ මාරු කිරීමේ බලය.

7. (1). මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකර ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූ ද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩසටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියකුගේ හෝ නියමය අනුව මාරුකළ හැකිය.

(2) මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන් කරන ලද මුදලක් ඒ ශීර්ෂයේ වැඩ සටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම්වරයාට පමණක්ම කළ හැකිය.

8. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට, හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල තවදුරටත් අවශ්‍ය නොවන බවට ආණ්ඩුකාරවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉවත් කරගැනීම, ආණ්ඩුකාරවරයා විසින් කරනු ලැබිය හැකිය.

මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට ආණ්ඩුකාරවරයාට ඇති බලය

9. ආණ්ඩුකාරවරයා විසින් —

(අ) මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ V වන තීරයෙහි, VII වන තීරයෙහි සහ VIII තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්,

(ආ) මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ VI වන තීරයෙහි දැක්වෙන අවම සීමා ඃ
නියමයන් මගින් 2023 මැයි මස 31 දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, ආණ්ඩුකාරවරයා විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනට පෙරාතුව වූ දිනයක සිට බලාත්මක විය යුතු යැයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන්වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතුය.

10. ආණ්ඩුකාරවරයා විසින්, ලිඛිත නියෝගයක් මගින්, මේ නියෝගයෙහි දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ;

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්,
(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන්
ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

11. මෙම අවසරය සබරගමුව පළාතේ හත් වන (7) පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි සිට හෝ මාස තුන (03)ක කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2022 දෙසැම්බර් මස 31 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

**ටිකිරි කොබ්බෑකඩුව,**
ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2021 නොවැම්බර් මස 29 වැනි දින.

**පළමුවන උපලේඛනය**

පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්
ශීර්ෂ 800 සිට 861 දක්වා

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | 34,132,000,000 |
| ප්‍රාග්ධන වියදම් | 3,057,000,000 |
| එකතුව | 37,189,000,000 |

| *ශීර්ෂය* | *ආයතන හා වැඩසටහන* | *පුනරාවර්තන වියදම රුපියල්* | *ප්‍රාග්ධන වියදම රුපියල්* |
|---|---|---|---|
| 800 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 83,919,000 | 2,340,000 |
| 801 | පළාත් සභා ලේකම් කාර්යාලය 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 190,045,000 | 1,000,000 |
| 802 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 24,020,000 | 1,000,000 |
| 803 | සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 12,785,000 | - |
| 804 | ප්‍රධාන ලේකම් | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 265,425,000 | 291,660,000 |
| 805 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) 03 වැනි වැඩසටහන -පළාත් පරිපාලනය | 41,195,000 | - |
| 806 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 61,338,000 | - |
| 807 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 62,356,000 | - |
| 808 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 312,850,000 | - |
| 809 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 80,941,000 | - |
| 810 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය,දේශීය වෛද්‍ය වනිතා කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 168,238,000 | 32,000,000 |
| | 47 වැනි වැඩසටහන - ප්‍රවාහන සේවා | 40,000,000 | 25,000,000 |
| | 49 වැනි වැඩසටහන - විදුලිබල හා බලශක්ති සේවා | | 10,000,0000 |
| | 53 වැනි වැඩසටහන- සමුපකාර සංවර්ධනය | | 5,000,000 |
| | 60 වැනි වැඩසටහන ප්‍රජා සංවර්ධනය | | 197,000,000 |
| | 61 වැඩ සටහන -නිවාස හා ප්‍රජා පහසුකම් | 2,685,000 | 20,000,000 |
| | 63 වැනි වැඩසටහන - වැවිලි යටිතල පහසුකම් හා වතු නිවාස | | 33,000,000 |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | | 630,000,000 |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | | 210,000,000 |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | | 60,000,000 |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| | 93 ආගමික හා සංස්කෘතික කටයුතු | | - |
| | 96 වැනි වැඩසටහන - කාන්තා සංවර්ධනය | | 9,000,000 |
| 811 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 288,000,000 | |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | 8,133,241,500 | |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | 1,527,000,000 | |
| 812 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | 584,065,000 | |
| 813 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 53 වැනි වැඩසටහන - සමුපකාර සංවර්ධනය | 120,887,000 | |
| 814 | පළාත් පාලන දෙපාර්තමේන්තුව 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 2,712,405,000 | |
| 820 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන -පළාත් පරිපාලනය | 102,540,000 | - |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් සහ මාර්ග නඩත්තුව | 510,000,000 | 300,000,000 |
| | 52 වැනි වැඩසටහන - ප්‍රාදේශීය සංවර්ධනය | | 20,000,000 |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | | 50,000,000 |
| 821 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | 80,050,000 | |
| 830 | සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන- පළාත් පරිපාලනය | 70,856,000 | - |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | | 48,000,000 |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 44,685,000 | 64,000,000 |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | | 90,000,000 |
| 831 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | 166,733,000 | |
| 832 | පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව 95 වැනි වැඩසටහන -සමාජ ආරක්ෂණය | 397,924,000 | |
| 840 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 124,803,100 | 19,000,000 |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | | 108,000,000 |
| | 81 වැනි වැඩසටහන - ද්විතියික අධ්‍යාපනය | 135,000,000 | 536,000,000 |
| | 93 වැනි වැඩසටහන - ආගමික හා සංස්කෘතික කටයුතු | 18,033,600 | 10,000,000 |
| 841 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 660,400,000 | |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | 5,673,300,000 | |
| | 81 වැනි වැඩසටහන- ද්විතීයික අධ්‍යාපනය | 10,566,050,000 | |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| | 87 වැනි වැඩසටහන - අධ්‍යාපන හා සහභාගීත්වය වැඩි දියුණු කිරීම | 27,760,000 | |
| | 88 වැනි වැඩසටහන - අධ්‍යාපන හා සැළසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 12,220,000 | |
| 850 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 77,966,000 | 1,500,000 |
| | 40 වැනි වැඩසටහන -ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | | 8,000,000 |
| | 43 වැනි වැඩසටහන - වාරිමාර්ග හා ජල කළමනාකරණය | 50,000,000 | 60,000,000 |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | | 110,000,000 |
| | 45 වැනි වැඩසටහන -පශු සම්පත් සංවර්ධනය | | 93,000,000 |
| | 55 වැනි වැඩසටහන - ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම | | 12,500,000 |
| 851 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 79,287,000 | |
| 852 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | 289,525,000 | |
| 853 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | 305,040,000 | |
| 861 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 28,381,800 | |
| | | 34,132,000,000 | 3,057,000,000 |

## දෙවන උපලේඛනය

### 2022 - ඇස්තමේන්තු

### අත්තිකාරම් ගිණුම් කටයුතු

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම්වල උපරිම සීමාව |
| මුළු එකතුව | | | | 2,553,650,000 | 858,126,500 | 7,380,876,450 | 3,250,000 |
| පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් | | | උප එකතුව | 2,419,400,000 | 800,586,500 | 7,334,856,450 | - |
| 1 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | 80001 | පළාත් රාː නිː අත්තිකාරම් | 2,000,000 | 700,000 | 6,665,000 | - |
| 2 | පළාත් සභා ලේකම් කාර්යාලය | 80101 | පළාත් රාː නිː අත්තිකාරම් | 1,600,000 | 850,000 | 5,260,000 | - |
| 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | 80201 | පළාත් රාː නිː අත්තිකාරම් | 1,200,000 | 600,000 | 4,672,500 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම්වල උපරිම සීමාව |
| 4 | සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය | 80301 | පළාත් රාः නිः අත්තිකාරම් | 1,000,000 | 300,000 | 3,094,950 | - |
| 5 | ප්‍රධාන ලේකම් | 80401 | පළාත් රාः නිः අත්තිකාරම් | 20,000,000 | 9,000,000 | 60,000,000 | - |
| 6 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) | 80501 | පළාත් රාः නිः අත්තිකාරම් | 3,500,000 | 800,000 | 9,000,000 | - |
| 7 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ) | 80601 | පළාත් රාः නිः අත්තිකාරම් | 8,000,000 | 1,457,000 | 13,623,000 | - |
| 8 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) | 80701 | පළාත් රාः නිः අත්තිකාරම් | 6,000,000 | 2,500,000 | 16,900,000 | - |
| 9 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | 80801 | පළාත් රාः නිः අත්තිකාරම් | 21,000,000 | 8,000,000 | 73,000,000 | - |
| 10 | පළාත් ආදයම් දෙපාර්තමේන්තුව | 80901 | පළාත් රාः නිः අත්තිකාරම් | 4,000,000 | 2,300,000 | 14,000,000 | - |
| 11 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 81001 | පළාත් රාः නිः අත්තිකාරම් | 6,200,000 | 3,744,000 | 32,456,000 | - |
| 12 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 81101 | පළාත් රාः නිः අත්තිකාරම් | 500,000,000 | 123,000,000 | 1,621,000,000 | - |
| 13 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 81201 | පළාත් රාः නිः අත්තිකාරම් | 27,000,000 | 15,000,000 | 74,000,000 | - |
| 14 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 81301 | පළාත් රාः නිः අත්තිකාරම් | 9,000,000 | 4,000,000 | 24,300,000 | - |
| 15 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 81401 | පළාත් රාः නිः අත්තිකාරම් | 4,900,000 | 3,000,000 | 18,150,000 | - |
| 16 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 82001 | පළාත් රාः නිः අත්තිකාරම් | 2,500,000 | 1,900,000 | 9,695,800 | - |
| 17 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 82101 | පළාත් රාः නිः අත්තිකාරම් | 2,000,000 | 910,000 | 5,130,400 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම්වල උපරිම සීමාව |
| 18 | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | 83001 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 8,000,000 | 3,075,500 | 27,428,800 | - |
| 19 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 14,000,000 | 9,750,000 | 30,250,000 | - |
| 20 | පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව | 83201 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 12,000,000 | 3,800,000 | 37,200,000 | - |
| 21 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 84001 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 9,500,000 | 3,000,000 | 30,900,000 | - |
| 22 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 84101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 1,700,000,000 | 575,000,000 | 5,055,000,000 | - |
| 23 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | 85001 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 7,000,000 | 2,000,000 | 20,500,000 | - |
| 24 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 85101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 7,500,000 | 4,500,000 | 23,000,000 | - |
| 25 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 85201 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 25,000,000 | 13,000,000 | 84,580,000 | - |
| 26 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 85301 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 15,000,000 | 7,500,000 | 29,000,000 | - |
| 27 | පාළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 86101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 1,500,000 | 900,000 | 6,050,000 | - |
| වෙනත් අත්තිකාරම් ගිණුම් | | | උප එකතුව | 134,250,000 | 57,540,000 | 46,020,000 | 3,250,000 |
| 28 | පළාත් සභා ලේකම් කාර්යාලය | 80102 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම් | 26,400,000 | 2,100,000 | 24,000,000 | - |
| 29 | කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - පුස්සැල්ල | 80502 | පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම් | 9,000,000 | 3,500,000 | 500,000 | 50,000 |
| 30 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 81002 | පරිගණක ව්‍යාපෘතිය | 350,000 | 140,000 | 270,000 | |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම්වල උපරිම සීමාව |
| 31 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 81004 | සබරගමුව පළාත් රංගශාලා අත්තිකාරම් ගිණුම | 1,200,000 | 1,000,000 | 250,000 | |
| 32 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 81202 | පින්නවල පංචකර්ම මධ්‍යස්ථානය | 1,800,000 | 300,000 | 500,000 | 500,000 |
| 33 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83102 | පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 52,000,000 | 20,000,000 | 10,000,000 | 1,000,000 |
| 34 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83103 | කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 9,500,000 | 8,000,000 | 8,000,000 | 1,000,000 |
| 35 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 84002 | මෙනේරිපිටිය - අටළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම | 16,000,000 | 10,000,000 | 2,000,000 | 500,000 |
| 36 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 85302 | උඳුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම | 18,000,000 | 12,500,000 | 500,000 | 200,000 |

EOG 02-0423/1

**අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය වන (6) පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසරක කාල සීමාව තුල සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති රුපියල් තිස්හත් බිලියන එකසිය අසූනව මිලියනයක් (රු. 37,189,000,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7 වන) පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2022 දෙසැම්බර් මස 31 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේ ය.

**ටිකිරි කොබ්බෑකඩුව,**
ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2021 නොවැම්බර් මස 29 වැනි දින

EOG 02-0423/2

---

**අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය වන (6) පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසරක කාල සීමාව තුල සබරගමුව පළාත් සභාවේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති මෙහි දෙවන (II) උපලේඛනයේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7 වන) පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2022 දෙසැම්බර් මස 31 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේ ය.

**ටිකිරි කොබ්බෑකඩුව,**
ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2021 නොවැම්බර් මස 29 වැනි දින

EOG 02-0423/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.